## සීමාසහිත ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගම - 2016

-----------------------------------------------------------------------------------------------

සීමාසහිත ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගමේ (සමාගම) 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මණ්ඩලයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කිරීමේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ මතය ව්‍යාවනය කිරීමේ ඡේදයෙහි වැදගත් කරුණු දක්වා තිබුණද, විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය.

### 1.4 මතය ව්‍යාවනය සඳහා පදනම

--------------------------------------

(අ) සීමාසහිත එල්ආර්ඩීසී සේවා (පෞද්ගලික) සමාගමේ සියයට 100 ක හිමිකාරිත්වය සමාගම සතුවේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව මව් සමාගම විසින් වාර්ෂිකව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වුවත්, සමාගම විසින් විගණන කාර්යයන් සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකෙරුණි.

(ආ) සමාගම විසින් කොන්ත්‍රාත් කටයුතුවලට අදාලව කෙරීගෙන යන වැඩ ලෙස රු.53,050,416 ක් 2016 දෙසැම්බර් 31 දිනට වාර්තා කර තිබුණි. අදාල ලිඛිත සාක්ෂි නොවීම නිසා මෙම ශේෂවල පැවැත්ම, සම්පූර්ණත්වය සහ නිවැරදිතාවය සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(ඇ) එක් නිෂ්පාදන යන්ත්‍රයකින් නිෂ්පාදනය කරනු ලබන නිමවුම්වල පවතින දෝෂයන් හේතුවෙන් එම යන්ත්‍රය සමාගමේ නිෂ්පාදන කටයුතු සඳහා යොදා නොගන්නා බව කර්මාන්තශාලාව පරීක්ෂා කිරීමේදී අනාවරණය විය. මෙම යන්ත්‍රය 2014 වර්ෂයේදී මිලට ගෙන තිබුණු අතර 2016 දෙසැම්බර් 31 දිනට එහි ශුද්ධ පොත් අගය රු.3,155,600 ක් විය. එසේවුවත් සමාගම විසින් මෙම වත්කමේ අයකරගත හැකි අගය මෙතෙක් නිශ්චය කර නොතිබුණු අතර මේ සම්බන්ධව හානිකරණ තක්සේරුවක් සිදුකර නොතිබුණි.

(ඈ) සේවක ණය, උත්සව අත්තිකාරම් සහ අනෙකුත් ණය ශේෂයන්වලට අදාලව පොදු ලෙජරයෙහි සහ සේවාදායකයා විසින් ඉදිරිපත් කරන ලද උපයෝගී උපලේඛන අතර පහත සඳහන් හඳුනා නොගත් වෙනස්කම් මට නිරීක්ෂණය විය.

| ගිණුමේ නම | පොදු ලෙජරය අනුව ශේෂය | උපලේඛන අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|
| | (රු.) | (රු.) | (රු.) |
| සේවක ණය | 3,498,952 | 3,711,597 | (212,645) |
| උත්සව අත්තිකාරම් | 267,121 | 202,000 | 65,121 |
| විශේෂ ණය | 2,941,063 | 2,447,164 | 493,899 |
| අනෙකුත් ණය | 559,814 | - | 559,814 |

මට නිරීක්ෂණය වූ ඉහත වෙනස්කම් සැසැඳීමට අවශ්‍ය ප්‍රමාණවත් සාක්ෂි සැපයීමට කළමනාකරණය අපොහොසත් වීම නිසා සමාගම විසින් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ඉහත ණය ශේෂයන්ගේ පැවැත්ම හෝ සම්පූර්ණත්වය තීරණය කිරීමට මට නොහැකි විය.

(ඉ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 2.4 (අ) අනුව සමාගම විසින් එහි කොන්ත්‍රාත් ආදායම් මුදල් පදනම මත හඳුනාගනු ලබයි. ඉදිකිරීම් කොන්ත්‍රාත්වල ප්‍රතිඵලය විශ්වාසදායි ලෙස ඇස්තමේන්තු කිරීම සඳහා සහ කොන්ත්‍රාත් ආදායම් හඳුනා ගැනීම සඳහා කොන්ත්‍රාත් පිරිවැය හා සම්බන්ධිත කොන්ත්‍රාත් ආදායම හා වියදම වාර්තාකරණ කාලපරිච්ඡේදයට අදාල කොන්ත්‍රාත් කටයුතුවල නිමවුම් අදියර අනුව හඳුනාගත යුතු වුවත් ඉහත ආදායම් හඳුනා ගැනීමේ ප්‍රතිපත්තිය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියේ 23.17 වගන්තියට අනුකූල නොවිණි.

(ඊ) අගය එකතු කළ බදු (VAT) වලට අදාල රු.210,619 ක මුදලක් අනෙකුත් ලැබිය යුතු මුදල් ලෙස දක්වා තිබුණු අතර මෙය වර්ෂ කීපයක සිට ඉදිරියට ගෙනවිත් තිබුණි. මෙම ශේෂයන්හි පැවැත්ම, සම්පූර්ණත්වය සහ නිවැරදිතාවය සන්නිරීක්ෂණය කිරීමට අදාල සතුටුදායක සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(උ) ස්වාධීන තහවුරු කිරීම් හෝ ගනුදෙනුවල අනෙකුත් උපයෝගී ලියවිලි/විස්තර නොවීම නිසා මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු පහත සඳහන් ශේෂයන්ගේ නිවැරදිතාවය සතුටුදායක ලෙස සනාථ කර ගැනීමට මට නොහැකි විය.

| අයිතමය | මුදල |
|---|---|
| | (රු.) |
| ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට ගෙවිය යුතු ණය | (1,200,000) |
| ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට ගෙවිය යුතු මුදල් | (19,685,960) |
| සීමාසහිත එල්ආර්ඩීසී සේවා (පෞද්ගලික) සමාගමට ගෙවිය යුතු මුදල් | (676,899) |
| ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවෙන් ලැබිය යුතු මුදල් | 13,488,123 |
| සීමාසහිත එල්ආර්ඩීසී සේවා (පෞද්ගලික) සමාගමට ගෙවිය යුතු මුදල් | 24,002 |

(ඍ) දීර්ඝ කලක සිට ලැබිය යුතු රඳවාගත් මුදල් හා ලැබිය යුතු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස පිළිවෙලින් රු.61,393,884 ක් හා රු.34,044,266 ක් 2016 දෙසැම්බර් 31දිනට සමාගම වාර්තා කර තිබුණි. එසේ වුවත් මෙම ශේෂවල පැවැත්ම, සම්පූර්ණත්වය හා නිවැරදිතාවය සතුටුදායක ලෙස සනාථ කර ගැනීමට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි.

(එ) අගය එකතු කළ බදු (VAT) වාර්තාවල ඇතුළත් බදු අයකළ හැකි සැපයීම් හා ලෙජරය අතර වෙනසක් මට නිරීක්ෂණය විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස අගය එකතු කළ බදු රු.9,533,358 ක් අඩුවෙන් වෙන් කර තිබුණි. එසේම, මෙම ශේෂවල පැවැත්ම, සම්පූර්ණත්වය සහ නිවැරදිතාවය සතුටුදායක ලෙස සනාථ කර ගැනීමට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි. විස්තර පහත දැක්වේ.

| අයිතමය | මුදල |
|---|---|
| | (රු.) |
| මුළු බදු අය කළ හැකි සැපයීම් - බදු වාර්තා අනුව | 358,399,142 |
| මුළු බදු අය කළ හැකි සැපයීම් - ලෙජරය අනුව | 421,954,864 |
| වෙනස | 63,555,722 |
| බදු බලපෑම (VAT අනුපාතය - 15%) | 9,533,358 |

(ඒ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව, සමාගම විසින් පහත සඳහන් හෙළිදරව් කිරීම් කළ යුතු විය.

(i) මුදල් අයකිරීම් පිළිබඳ නොසලකා වාර්තාකරණ ඒකකය සහ සම්බන්ධිත පාර්ශවයන් අතර හුවමාරු වන සම්පත්, සේවාවන් හෝ බැදීම් හා සම්බන්ධ සම්බන්ධිත පාර්ශවයන් අතර සිදුවන ගනුදෙනු

(ii) පහත සඳහන් විෂයන් යටතේ එනම් (අ) කෙටිකාලීන සේවක ප්‍රතිලාභ (ආ) පශ්චාත් සේවා ප්‍රතිලාභ (ඇ) අනෙකුත් දිගුකාලීන ප්‍රතිලාභ (ඈ) සේවය අවසන් කිරීමේ ප්‍රතිලාභ, සහ (3) හිමිකාරිත්වය අනුව ගෙවීම්, සමාගමේ කටයුතු සෘජුව හෝ වක්‍රව සම්පූර්ණයෙන් සැලසුම් කිරීම, මෙහෙයවීම හා පාලනයට බලය ඇති සහ වගකිව යුතු ප්‍රධාන කළමනාකරණ තනතුරු හොබවන පුද්ගලයන්ට ගෙවනු ලබන වන්දි

(iii) අවිනිශ්චිත අනාගත සිද්ධියකින් සිදුවීමේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවිය හැකි අසම්භාව්‍ය වගකීම් සහ අවිනිශ්චිත අසම්භාව්‍ය ප්‍රතිලාභයක් මත ඇතිවිය හැකි අසම්භාව්‍ය වත්කම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ක) මාගේ පසුගිය වර්ෂයට අදාල වාර්තාවේ "වෙනත් කරුණු" ඡේදයෙහි ඇතුළත් ආදායම්, කොන්ත්‍රාත්වල කෙරීගෙන යන වැඩ, ලැබිය යුතු මුදල්, ලැබිය යුතු බදු ආදායම් හා සම්බන්ධිත පාර්ශවයන් සමඟ ගනුදෙනුවලට අදාලව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ශේෂයන්ට යටත්ව මතය තත්ත්වාගණනය කරන ලදී. එසේවුවත්, 2015 දෙසැම්බර් 31 දිනට පැවති ශේෂයන් නැවත දැක්වීමේ සාධාරණත්වය තීරණය කිරීමට අදාල අතිරේක තොරතුරු මා වෙත ලබා නොදීම නිසා ඒවායෙහි පැවැත්ම, සම්පූර්ණත්වය හා නිවැරදිතාවය සනාථ කර ගැනීමට මට නොහැකි විය.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය ව්‍යාචනය කිරීම

මෙම වාර්තාවේ මතය ව්‍යාචනය සඳහා පදනම් ඡේදයෙහි දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් ප්‍රකාශ කිරීමට පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොටගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**2.1.1 අනෙකුත් නීති හා රෙගුලාසිවල අවශ්‍යතාවයන් වාර්තා කිරීම**

---

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තියේ අවශ්‍යතාවයන් පිළිබඳ මා විසින් පහත කරුණු දක්වමි.

(අ) මතය සඳහා පදනම සහ විගණනයේ විෂය පථය හා සීමාවන් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) මාගේ මතය පරිදි, සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 7 දරන සමාගම් පනතේ 148(2) සහ 151 වගන්තිවල අවශ්‍යතාවයන්ට අනුකූල නොවිණි.

**2.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකාරිත්ව තීරණ යනාදියට අනුකූල නොවීම**

---

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත පරිදි වේ.

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| **(අ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| | මුදල් රෙගුලාසි 371 | ලංකා බැංකුවේ හැටන් ශාඛාවේ පවත්වාගෙන යන ජංගම ගිණුමට අදාලව 2017 ජනවාරි සිට දෙසැම්බර් දක්වා වූ මාසවල බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි. |
| **(ආ)** | **2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය** | |
| | (i) 7.4.5 වගන්තිය | සමාගමේ ස්ථාවර වත්කම් සමීක්ෂණය සඳහා වාර්ෂික සමීක්ෂණ මණ්ඩල හා විශේෂ සමීක්ෂණ මණ්ඩල පත්කර නොතිබුණි. |
| | (ii) 7.4.1 වගන්තිය | අවම වශයෙන් මාස 3 කට එක් වරක් වන පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. |
| (ඇ) | අංක 1823/05 හා 2013 අගෝස්තු 12 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය | හුවමාරු මිල ප්‍රතිපත්තියක් හඳුන්වාදීම සඳහා විධිමත් හුවමාරු මිල පිළිබඳ අධ්‍යයනයක් සමාගම විසින් සිදුකර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

---

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ බදු පෙර ශුද්ධ ලාභය රු.මිලියන 5.7 ක් වූ අතර ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය වූ රු.මිලියන 51.4 සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 45.7 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ කොන්ත්‍රාත් හා වැඩපොලවල් වලින් ලද ආදායම රු.මිලියන 82.4 කින් අඩුවීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

### 3.2.1 වැදගත් ගිණුම්කරණ අනුපාත

ලබාගත හැකිවූ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව සමාගමේ වැදගත් අනුපාතයන් පහත දැක්වේ.

| | 2016 | 2015 |
|---|---|---|
| දළ ලාභ ආන්තිකය (ප්‍රතිශතය) | 9.49 | 15.18 |
| ශුද්ධ ලාභ ආන්තිකය (ප්‍රතිශතය) | 1.36 | 10.33 |
| ජංගම අනුපාතය (වාර ගණන) | 1.37 | 1.29 |
| ණයගැති පිරිවැටුම් අනුපාතය (වාර ගණන) | 9 | 10 |
| ණය එකතු කර ගැනීමේ කාලය (දින) | 40 | 33 |

මේ සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාගමේ කොන්ත්‍රාත් ආදායම හා අනෙකුත් මෙහෙයුම් ආදායම් රු.මිලියන 82.4 කින් හා රු.මිලියන 5.6 කින් එනම් පිළිවෙලින් සියයට 19 කින් හා සියයට 53 කින් අඩුවීම නිසා 2015 වර්ෂයේ සියයට 15.18 ක් වූ දළ ලාභ ආන්තිකය 2016 වර්ෂයේදී සියයට 9.49 දක්වා අඩුවී තිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස සමාගමේ දළ ලාභ අනුපාතයද කැපී පෙනෙන පරිදි අඩුවී තිබුණි.

(ආ) ණයගැති පිරිවැටුම් අනුපාතය සහ ණය එකතු කර ගැනීමේ කාලය ඉතා දුර්වල මට්ටමක පැවතුණි. මේ අනුව සමාගමේ ණය කළමනාකරණ ක්‍රියාවලිය සතුටුදායක තත්ත්වයක නොවුණු බව නිරීක්ෂණය විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය අනුව, මූලික පරමාර්ථ සහ ප්‍රධාන කාර්යයන් ඇතුළත් කරුණු;

(අ) නාගරික සංවර්ධන අධිකාරියේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන දේපල සංවර්ධන ව්‍යාපෘති භාරගෙන කරගෙන යාමේ ව්‍යාපාර කටයුතුවල පමණක් නිරත වීම.

(ආ) ඕනෑම ගොඩනැගිල්ලක්, කාර්මික, ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති සඳහා කවර ආකාරයක හෝ පහත් බිමක්, වගුරු හෝ වගුරු සහිත බිම් ප්‍රදේශ ගොඩකිරීම හා සංවර්ධනය කිරීම.

(ඇ) ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව සතු ඕනෑම ඉඩමක් කවර ආකාරයකට හෝ අයත් කර ගැනීම, කළමනාකරණය හා පාලනය සඳහා ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව සමඟ ගිවිසුම්වලට එළඹීම.

(ඈ) මාර්ග ඉදිකිරීම් කටයුතු, මහජන සේවා සැපයීම සඳහා වන ඉදිකිරීම් කටයුතු, මලාපවහන හා කසල ශෝධනය, ආලෝකනය සහ ජල සැපයුම යනාදියද ඇතුලත්ව, ගාස්තුවක් අයකර හෝ වෙනත් ආකාරයකට ඕනෑම ආකාරයකින් දේපල සංවර්ධනය කිරීමට සහ සේවාවන් සැපයීම සඳහා ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට සහය වීම.

(ඉ) වාරිමාර්ග, මුහුද ගොඩකිරීමේ සහ වෙරළ සංරක්ෂණය යන ක්ෂේත්‍රවල වරාය හා නැංගුරම්පලවල් ඉදිකිරීම හා වැඩ පවරා ගැනීම.

(ඊ) ගොඩනැගිලි ඉංජිනේරුමය කාර්යයන් හා ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය නිෂ්පාදනයද ඇතුලත්ව ගොඩනැගිලි, ඉංජිනේරුමය කාර්යයන් හා ඉදිකිරීම් කටයුතු කරගෙන යාම.

(උ) ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාල උපදේශන කටයුතු සහ ඕනෑම උපදේශන කාර්යභාරයක් ඉටු කිරීම සඳහා භාර ගැනීම.

ඉහත අරමුණු ලභාකර ගැනීමට සහ ප්‍රධාන කාර්යයන් ඉටු කිරීමට අදාලව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉහත (ඉ) ඡේදයෙහි දක්වන ලද කරුණ හැර අනෙකුත් අරමුණු ඉටුකර ගැනීම සඳහා පියවරගෙන නොතිබුණි.

(ii) ලබාගත හැකිවූ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂයේදී සහ ඉකුත් වර්ෂයේදී කර්මාන්තශාලාවලින් සහ වැඩපලකින් (ප්‍රධාන කාර්යාලයේ පොදුකාර්ය පිරිවැය හැර) ලබාගත් දායකත්වය පහත පරිදි වේ.

| **කර්මාන්ත ශාලාවේ නම** | **දායකත්වය** | |
|---|---|---|
| | **2016** | **2015** |
| | **රු.මිලියන** | **රු.මිලියන** |
| නාවල කර්මාන්ත ශාලාව - සිමෙන්ති ගල් | (12.43) | (16.88) |
| නාවල කර්මාන්ත ශාලාව - පෙරසවි | 13.32 | 8.88 |
| නාවල අංගනය - වැඩපොල | (5.45) | 0.92 |
| කොටගල කර්මාන්ත ශාලාව | (0.93) | (0.24) |
| අම්පාර කර්මාන්ත ශාලාව | (0.41) | (0.66) |
| හම්බන්තොට කර්මාන්ත ශාලාව | (1.53) | (2.54) |
| හිගුරක්ගොඩ කර්මාන්ත ශාලාව | (0.11) | (0.10) |
| ත්‍රිකුණාමලය කර්මාන්ත ශාලාව | 0.14 | (0.99) |

කර්මාන්ත ශාලා 7 ක හා වැඩපලක දායකත්වය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

2016 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමස්ථ කර්මාන්ත ශාලා 7 න් කර්මාන්තශාලා 5 ක සහ වැඩපළෙහි මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.මිලියන 20.86 ක ඍණ දායකත්වයක් වූ අතර ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ එම ඍණ දායකත්වය රු.මිලියන 21.41 ක් විය. යන්ත්‍රවල ධාරිතාවය හා මානව සම්පත් ඌණ උපයෝජනය මෙකී ඍණ දායකත්වය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4.2 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඌන නිෂ්පාදනතාවය සහ විකුණුම් ආදායම අඩුවීම යන කරුණු මත සමාගමේ කර්මාන්තශාලා හා වැඩපල දිගින් දිගටම අලාභ ලබමින් තිබුණද, කළමනාකරණය විසින් අලාභ අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ආ) සමාගම විසින් එහි නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා තාක්ෂණික වශයෙන් යල්පැනගිය යන්ත්‍ර භාවිතා කරමින් සිටින අතරම යන්ත්‍ර ක්‍රියා විරහිත වීම්වලදී භාවිතා කිරීම සඳහා මෙවලම් හෝ උපකරණ සමාගම සතුව නොතිබුණි.

(ඇ) වැඩමුර වේලාවන් හඳුන්වා දෙනු වෙනුවට සමාගමේ සේවයන් සඳහා ස්ථාවර වැඩ කාලයක් හඳුන්වා දී තිබුණි. මේ අනුව සමාගමේ වර්තමාන වැඩමුර සේවා කාලය පෙ.ව.8.30 සිට ප.ව.4.30 දක්වා විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සමාගමේ නිෂ්පාදනතාවය කැපීපෙනෙන ලෙස අඩුවී තිබුණු අතර සමාගමට පවතින වෙළෙඳපල ඉල්ලුම සපුරාලීමට අපොහොසත් වී තිබුණි.

**4.3 මෙහෙයුම් දූර්වලතා**

---

ලැබෙන කොන්ත්‍රාත් සමාගම විසින්ම සෘජුව ඉටු කිරීමට විධිවිධාන සැලසීමෙන් තොරව, ප්‍රමාණවත් මානව හා අනෙකුත් සම්පත් නොවීම නිසා බොහොමයක් කොන්ත්‍රාත් පුරුද්දක් වශයෙන් බාහිර පාර්ශවයන් වෙත උපකොන්ත්‍රාත් ලෙස ලබාදී තිබුණි. මෙම නිසා සියයට 3 සිට සියයට 5 අතර වූ අඩු ආන්තිකයක් පමණක් සමාගමට උපයා ගැනීමට හැකිවී තිබුණි.

**4.4 ප්‍රසම්පාදන ක්‍රියාවලිය**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විධිමත් ආකාරයට නිලධාරීන් අතර වැඩ බෙදීමක් සිදු නොකර, ගැනුම් ඇනවුම් අනුමත කිරීම, මිල ගණන් ලබා ගැනීම සහ ගැනුම් සඳහා ගෙවීම් කිරීම යනාදිය සමාගමේ සාමාන්‍යාධිකාරීවරයා සිදුකර තිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ප්‍රතිපාදනවලට පටහැනිව, සමාගමේ ගණකාධිකාරී සහ ඉංජිනේරුවරයා තාක්ෂණික ඇගයීම් කමිටුවට සහ ප්‍රසම්පාදන කමිටුව යන කමිටු දෙකටම පත්කර තිබුණි.

**4.5 මානව සම්පත් කළමනාකරණය**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අංක පීඊඞී/12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.1.14 වගන්තිය ප්‍රකාරව, එක් එක් තනතුර සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියක් සකස් කර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවති සැපයුම් කළමනාකරු, ඉංජිනේරු යනාදි ඇතැම් ප්‍රධාන තනතුරු 2017 ජූලි 03 දින වනතුරුත් පුරවා නොතිබුණි. මේ නිසා මෙම තත්ත්වය සමාගමේ මෙහෙයුම්වල සුමට ක්‍රියාකාරිත්වයට අහිතකර ලෙස බලපා තිබුණි.

(ඇ) විධිමත් සුපරීක්ෂණයක් නොවීම නිසා කොන්ත්‍රාත් කටයුතුවල නිරතවන සේවකයන් සමාගම විසින් නියමකර ඇති සෞඛ්‍ය හා ආරක්ෂක විධිවිධානවලට අනුකූලව කටයුතු නොකරන බව විගණනයේදී නිරීක්ෂණය විය.

**4.6 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්**

---

නිමවුම්වල නිරීක්ෂණය වූ ඇතැම් දෝෂයන් හේතුවෙන් 2014 වර්ෂයේදී මිලටගෙන තිබුණු රු.3,155,600 ක් වටිනා බ්ලොක් ගල් නිෂ්පාදන යන්ත්‍රයක් භාවිතා නොකර නාවල කර්මාන්ත ශාලාවේ රඳවා තිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

### 5.1 සංයුක්ත සැලැස්ම

---------------------

අංක පීඊඩී/12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ නියමයන්ට අනුව, සමාගම විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 5.2 ප්‍රසම්පාදන සැලැස්ම

------------------------

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මඟපෙන්වීම්වලට අනුව සමාගම විසින් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 5.3 අයවැය පාලනය

-------------------

අංක පීඊඩී/12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2 වගන්තිය ප්‍රකාරව සමාගම විසින් වාර්ෂික අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා පිළිබඳව වරින්වර සමාගමේ කළමනාකරණ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සඳහා විශේෂ අවධානයක් යොමුකළ යුතු වේ.

| පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | (i) සමාගම භාවිතා කරනු ලබන ගිණුම්කරණ මෘදුකාංගයෙහි ගිණුම් ආකෘතිය සමාගම විසින් මාසිකව වාර්තා කරන කලමනාකරණ ගිණුම් ආකෘතියෙහි අවශ්‍යතාවයන්ට අනුරූප නොවිණි. |
| | (ii) සමාගමේ මූල්‍ය අංශය මඟින් ගිණුම් කටයුතු සඳහා ගිණුම් අත්පොතක් භාවිතා කර නොතිබුණි. |
| (ආ) අභ්‍යන්තර පාලනය | (i) විධිමත් අභ්‍යන්තර පාලන අත්පොතක් සමාගම පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| | (ii) අභ්‍යන්තර පාලනයේ කොටසක් ලෙස අභ්‍යන්තර විගණන කාර්යයන් ඉටු කර නොතිබුණි. |